සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

57 | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

## Third Term Test - Grade 13 - 2016

විභාග අංකය ............................ **නාට්‍ය හා රංග කලාව II** කාලය පැය තුනයි

උපදෙස්

- I කොටස II කොටසෙහි සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

## I කොටස

❖ එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

1) වත්මන් දේශපාලන පසුබිම විනිවිද දැකිය හැකි ආකාරයෙන්, නව අර්ථකථනයක් සහිතව නිර්මාණය කර ඇති නාට්‍ය වන්නේ,

I ) හස්තිකාන්ත මන්තරේ II) ඇන්ටිගනී III) සුභ සහ යස
IV) හුණුවටයේ කථාව V) මූදු පුත්තු (......)

2) "ඒත් ඉහළම හිනි පෙත්තට නැග්ගාට පස්සේ වළාකුළු දිහා ඇහැ ගහගෙන නිහතමානීකමට පයින් ගහනවා" මෙය කුමන නාට්‍යයක එන සංවාදයක්ද?

I ) ජුලියස් සීසර් II) සුභ සහ යස III) රුකඩ ගෙදර IV) ඔතෙලෝ V)ඇන්ටිගනී (......)

3) "ඇන්ටිගනී" නාට්‍යය සඳහා මූලාශ්‍ර වී ඇත්තේ පහත සඳහන් කෘති අතරින් කුමන කෘතියද?

I) ට්‍රෝජන් කාන්තාවෝ II)සෙවන් අගේන්ස්ට් තීබ්ස් III)ඊඩිපස් රජ IV)මීඩියා V)ලියර් රජ (......)

4) "හොඳයි මතක් කරපු එක. මට දැන් ඒක අමතක වෙලා තිබුණේ. මොකද දන්නවද ඒ?"
ඉහත සඳහන් සූත්‍රධර විසින් පවසන සංවාදයේ "අමතක වී යාම" කාලිදාසයන් ඉඟියකින් පවසන්නේ,

I) දූර්වාසස් ඍෂිවරයාට ආගන්තුක සත්කාර කිරීමට ශකුන්තලාට අමතක වීමයි.
II) දුෂ්‍යන්ත රජුට තම රාජ්‍යය අමතක වීමයි
III) ශකුන්තලා අතින් මුදුව ගිලිහී යාම අමතක වී යාමයි
IV) සර්වදමනට ගෙලෙහි බැඳි මාලය අමතක වීම
V) දුෂ්‍යන්ත රජුට ශකුන්තලා අමතක වී යාමයි (......)

5) "රුකඩ ගෙදර" නාට්‍යයේ "තරන්තලා නැටුම" තුළින් වඩාත් සංකේත වන්නේ,

I) සමස්ත නාට්‍යයේ ම වියවුලයි (II) හෙල්මගේ මානසික වියවුලයි
(III) නිවසෙහි පවතින වියවුල් ස්වභාවයයි (IV) දොස්තර රන්ක්ගේ මානසික වියවුලයි
(V) නෝරාගේ මානසික වියවුලයි (......)

❖ පහත දැක්වෙන තොරතුරු ඇසුරින් අංක 6 -10 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - අනුරූපණය මාධ්‍යයෙන් කතාවක් කියයි.

B - විභූෂණය, හැඬය, වර්ණය, ආභරණ යන අර්ථ දෙයි.

C - ගැමි භාණ්ඩ ; රංග භාණ්ඩ ලෙස යොදා ගනී

D - ස්ථාවර රංග මණ්ඩප, නූතන රංග භූමි, නවීන රංගෝපකරණ පරිහරණය කරන ලදි

E - මධ්‍යම පාන්තික තේමාවන් නාට්‍ය සඳහා යොදා ගනී

F - ක්‍රිස්තියානි ජන වන්දනා හා මිෂනාරි ආගමික අභාසය ලබා ඇත

G - ස්ත්‍රීන් පළමු වරට රංගාවතරණය කරන ලදි

H - රංග භූමියෙහි “වෙස් අත්ත“ දැකිය හැක.

I - දේශනවාදීන් හා හඬ දූතයන් ස්ථාවර රංග පාත්‍රයෝ වෙති

J - ග්‍රාමීය විකට ජවනිකා බහුලව භාවිතා කරයි

6)මෙහි නාඩගම් හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,

I) . A හා E ය  II). Fහා I ය  III). B හා F ය  IV). F හාHය  V). C හාD ය  (......)

7)මෙහි කෝලම් නාට්‍ය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,

I ). Bහා Hය  II). H හාIය  III). Hහා Dය  IV). Fහා Iය  V). C හා H ය  (......)

8)මෙහි නූර්ති නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

I) . BහාG ය  II). G හා F ය  III). Bහා D ය  IV). Dහා Gය  V) G හා A ය  (......)

9)මෙහි “සොකරි“ නාටකය හා සම්බන්ධ වන්නේ,

I ). A හාDය  II). Dහා Iය  III). Aහා C ය  IV). Aහා I ය  V). B හා Cය  (......)

10) මෙහි ජයමාන්න නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,

I) . A හා E ය  II). Gහා J ය  III). Eහා J ය  IV). Iහා J ය  V). DහාH ය  (......)

❖ පහත දැක්වෙන මාතෘකා ආශ්‍රයෙන් 11 – 16 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| A | - | මැණික්පාල බිසව | E | - | වසවර්ති මාරයා | I | - | මිලින්ද ප්‍රශ්නය |
| B | - | රිද්දි බිසෝවරුන් | F | - | දුනුමාලප්පුව | J | - | ගැබිණි කාන්තාවන් |
| C | - | සේරමාන් රජු | G | - | සංඛපාල රජු | K | - | මරා ඉපැද්දීම |
| D | - | බණ්ඩාර දෙවි හත්කට්ටුව | H | - | කපු යක්කාරිය | L | - | දොරකඩ අස්න |

11) සන්නි යකුම ශාන්තිකර්මයට අදාළ වන්නේ,

I ). G හා Jය  II).B හා K ය  III). Hහා J ය  IV). Bහා C ය  V). D හා E ය  (......)

12) මඩු ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,

I) . Gහා K ය  II). Cහා K ය  III). Cහා G ය  IV). Eහා K ය  V). Gහා Jය  (......)

13) සූනියම් යාගය හා සම්බන්ධ වන්නේ,

I) . Cහා J ය  II). B හා K ය  III). A හා E ය  IV). Cහා F ය  V). F හා L ය  (......)

14)කොහොඹා කංකාරිය හා සම්බන්ධ වන්නේ,

I) . A හා E ය  II). Bහා G ය  III). Eහා K ය  IV). D හා F ය  V.) Dහා F ය  (......)

15)රට යකුම හා සම්බන්ධ වන්නේ,

I) . A හා J ය  II). E හා H ය  III). Dහා J ය  IV). A හා B ය  V). B හා H ය  (......)

16)මෙහි පූජාකර්ම හා සම්බන්ධ වන්නේ,

I ). I හා L ය  II) A හා F ය  III). G හා J ය  IV). D හා F ය  V). Iහා K ය  (......)

❖ පහත දැක්වෙන මාතෘකා ඇසුරින් අංක **17 – 21** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | - කොරොෂි නො-බි | F | - එව්රි මැන් | K | - කන්ජින් චෝ |
| B | - ඉක්යුක්ලීමා | G | - රාවණේසන් | L | - චක්‍ර නාට්‍ය |
| C | - කුත්තු | H | - කෞශල්‍යා | M | - ස්කිනීය |
| D | - කොකේන් | I | - ලංකා සුබෝධ විලාස සභා | N | - ප්‍රාණඝාතයේ විපාක |
| E | - ඕකෙස්ට්‍රා | J | - නොකිවසු | 0 | - මනුලොව |

17) ජපන් නෝ නාට්‍ය කලාව සම්බන්ධ වේ.
I ). D,H,හා N ය  II). B,G,හාN ය  III). H,Iහා,Lය  IV). J,I,හාM ය  V). E,F,හාH ය (......)

18) ජපන් කබුකි නාට්‍ය කලාව හා සම්බන්ධ වේ.
I) .B,CහාFය  II). I,J,හාK ය  III.) A,J,හා K ය  IV)  L,M,හා  O ය V). E,I,හා M ය (......)

19) ක්‍රිස්තියානි ජන වන්දනා නාට්‍ය කලාව හා සම්බන්ධ වේ.
I) . B,D,හා Jය  II) D,J,හා N ය  III.) F,J,හා K ය  IV). H,J,හා N ය V). F,L,හා Oය (......)

20) ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ වේ.
I ). D,H,හා J ය  II). G,F,හා K ය  III). D,E,හා H ය V). B,Eහා ,M ය V) G,K,හා O ය (......)

21) දෙමළ නාට්‍ය හා සම්බන්ධ වේ.
I ). C,Gහා ,Iය  II.) D,H,හා L ය  III). I,Kහා ,L ය  IV). E,Gහා ,L ය  V). H,K,හා N ය (......)

❖ අංක **22 – 25** තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

22) අද්භූත, ප්‍රේමණීය, චමත්කාර වැනි අරුත්වලින් සමන්විත නාට්‍ය රීතිය වන්නේ,
I). අඛ්‍යාන රංග රීතිය  II). අසම්මතවාදී රීතිය  III). රොමැන්ටික් රංග රීතිය
IV). ස්වභාවිකවාදී රංග රීතිය  V.) යථාර්ථවාදී රංග රීතිය (......)

23) රංග වින්‍යාසය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
I) .  නාට්‍යමය පිටපත ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒමට භාවිතා කරන ප්‍රධානතම මාධ්‍යයයි.
II) .  සංචලනය පදනම් කර ගෙන අනුෂාංගික කලා යොදා ගෙන නිර්මාණය කරන වේදිකා චිත්‍රයයි.
III) . හුදෙක් රංග අවස්ථා අලංකරණය සඳහා පමණක් භාවිතා කරන්නකි.
IV).  නර්තනමය චලනයන්ට පමණක් සීමා වී පවත්නා නිර්මාණාත්මක ක්‍රියාවලියකි.
V) .  මෙය නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලියට පමණක් ආවේණික වූවකි (......)

24) "වේදිකාවේ සෙලවෙන ගිනිදැල් වලින් යුක්ත යුදමය වාතාවරණයකි "එම අවස්ථාව වඩාත් සජීවි ලෙස පෙන්වීමට යොදා ගන්නා නවීන තාක්ෂණික පහන් වර්ගය වන්නේ,
(I) වර්ණ චක්‍රය  (II) යොමු පහන්  (III) හැලජන් පහන්
(IV) ප්‍රයෝග  (V) ප්‍රක්ෂේපනය සෙවනැලි නිර්මිත පහන් (......)

25) නාට්‍ය කලාවේ අරාජික කාල වකවානුවකදී විදග්ධ නාට්‍ය කලාවක් බිහි කිරීමෙහි ලා පුරෝගාමී වූයේ,
(I) නියුමන් ප්‍රබාල්  (II) සුගතපාල ද සිල්වා  (III) රොබට් පී. නියුටන්
(IV) ලුයිජි පිරන්ඩලෝ  (V) ඊ.එෆ්.සී.ලුඩොවයික් (......)

❖ පහත දැක්වෙන ලෙස නම් කර ඇති ඡායාරූප ඇසුරෙන් අංක **26 – 30** තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
|  |  |  |  |  |  |
| A | B | C | D | E | F |

26) හැත්තෑව දශකයේ නාට්‍ය නිර්මාණකරුවෙකු වන්නේ,
I) B ය II.) C ය III). A ය IV.) D ය V.) E ය (......)

27) ඉංග්‍රීසි නාට්‍ය කලාව සම්බන්ධ නිර්මාණකරුවෙකු වන්නේ,
I) . E ය II.) F ය III) A ය IV). C ය V) D ය (......)

28) "සංකරම්" නාට්‍යය නිෂ්පාදනය කළ නිර්මාණකරුවා වන්නේ,
I) . E ය II). D ය III). A ය IV.) C ය V) Bය (......)

29) ත්‍රිමාන පසුතල භාවිතය යථාර්ථවාදී නාට්‍ය රීතියට සරිලන ලෙස භාවිත කල නාට්‍යකරුවා වන්නේ,
I). B ය II.) A ය III). C ය IV). D ය V). Eය (......)

30) "හංස ගීතය" නාට්‍ය නිෂ්පාදනය කල නිර්මාණකරුවා වන්නේ,
I ) Aය II) Bය III). C ය IV) D ය V) Eය (......)

❖ පහත වගුව ඇසුරෙන් **31 - 34** තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| A | B | C | D | E |
|---|---|---|---|---|
| පත්තිරිප්පුව<br>අර්ධ කවාකාර වැට කළු තිරය | රංග ශීර්ෂය<br>මත්තවාරණී<br>ප්‍රේක්ෂකගෘහ | හනම්චිය<br>මවරිබුතයි<br>කකිවරි | කිරිදෝ<br>ෂිරෂුබෂිගෝ<br>බුතායි | අල්තාරය<br>පැරඩෝස්<br>පැරසීනියම් |

31) ගම්බද පෙදෙස් වල ජීවමාන නාට්‍ය කලාවක් බවට පත් වූ නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
I ). C ය II). B ය III.) A ය IV). D ය V). Eය (......)

32) චරිත නිරූපණය සඳහා වෙස් මුහුණු භාවිත කරන ලද නාට්‍ය සම්ප්‍රදායන් දෙකක් හා සම්බන්ධ වන්නේ,
I) . A ,හා C ය II). C හා ,E ය III) B හා , C ය IV). A හා , D ය V). A ,හා E ය (......)

33) “භරත නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් වන පරිදි විශ්වකර්මයා ලවා නිර්මාණය කරන ලදැයි සැලකෙන රඟහල හා සම්බන්ධ වන්නේ,
I) . A ය II). B ය III). C ය IV). D ය V). E ය (......)

34)නළුවෙකු වීමට ළමා අවධියේ සිට පුහුණු වීම් කළ යුතු නාට්‍ය සම්ප්‍රදාය හා සම්බන්ධ වන්නේ,
I ). A ය II). B ය III). C ය IV) Dය V). E ය (......)

❖ අංක 35 – 37 තෙක් ප්‍රශ්න වල නොගැලපෙන පිළිතුර තෝරන්න.

35) නාට්‍ය සංගීතයේ ලක්ෂණ වන්නේ,
   (I) වචනාර්ථයට ඔබ්බෙන් පවතින ගැඹුරු මනෝභාවයන්ට ආමන්ත්‍රණය කල හැකි වීම
   (II) සංගීතඥයාගේ ශාස්ත්‍රීය දැනුම් සම්භාරය අන්තර්ගත කොට නිර්මාණය කිරීම
   (III) ඖචිත්‍යයෙන් යුතු වීම හා නළුවාගේ භාව ප්‍රකාශනයට ඉවහල් වීම
   (IV) ආදේශ භාණ්ඩ වලින් ද විවිධ ශබ්ද හා හඬ අවස්ථානෝචිතව යොදා ගැනීම
   (V) දෘශ්‍ය කාව්‍යමය ගුණය තීව්‍ර කිරීමට දායක වීම (......)

36) පාස්කු නාට්‍යයේ රංග අවස්ථාවන් හා සම්බන්ධ වේ.
   (I) මුල් කාලීන පාස්කු රඟ දක්වන ලද්දේ රූකඩ මගිනි.
   (II) "ඇහැලේපොල කුමාරිහාමි" හා සම්බන්ධ සිදුවීම මුල් කාලීනව රඟ දක්වා ඇත
   (III) මන්නාරමේ පේසාලෙයි ගමෙහි මේවා ආරම්භ වී ඇතැයි සැලකේ
   (IV) රූප රඟ දක්වන්නෝ " රඟ සෙවින්" නමින් හැඳින්වේ
   (V) පාස්කු නාට්‍ය ඇරඹෙන්නේ ගොප් ඉරිදාය (......)

37) වේදිකා නාට්‍යයක ආවේණික ලක්ෂණ වන්නේ,
   (I) රූපණය සඳහාම කළ නිර්මාණයක් වීම
   (II) සජීවී බව
   (III) ගැටුම් අවස්ථාවන් තිබීම
   (IV) අභිනය භාවිතා කිරීම
   (V) ප්‍රේක්ෂකාගාරයක රඟ දක්වනු ලැබීම (......)

❖ නිවැරදි පිළිතුරු සපයන්න.

38) "කෝ පේන් නෑ දෙන්නට දෙන්නා මූණ ගැහුනද දන්නේ නෑ"
   ඉහත සංවාද ඛණ්ඩය ඇතුලත් නාට්‍යයේ මූලාශ්‍ර කථාව වන්නේ,
   (I) ශාකුන්තලෝ පාඛ්‍යානය
   (II) ප්‍රතිඥායෞගන්ධරායණ
   (III) සෙවන් අගේනස්ට් තීබ්ස්
   (IV) ඊඩිපස් රජ
   (V) පද්ම පුරාණය (......)

39) ද්‍රවිඩ ජනතාවගේ කාන්තාවන් උදෙසා පැවැත්වෙන පූජාවක් වන්නේ,
   I ). මහා ශිව රාත්‍රී II). දීපාවලී III). තෛපොංන්ගල්
   IV.) නව රාත්‍රී මංගල්‍යය V ) . මාඩු පොංගල් (......)

40) ෂේක්ස්පියර්ගේ ට්‍රැජිඩි නාට්‍ය කෙරෙහි බෙහෙවින් බලපෑවේ,
   (I) ග්‍රීක ශෝකාන්ත නාට්‍යයන්ය
   (II) සෙනෙකාගේ නාට්‍ය කෘතීන්ය
   (III) ටයිටස් මැසියස් ප්ලූටස්ගේ රෝම සුඛාන්ත නාට්‍යයන්ය
   (IV) සොෆොක්ලීස්ගේ ශෝකාන්ත නාට්‍යයන්ය
   (V) මිනැන්ඩර්ගේ ශෝකාන්ත නාට්‍යයන්ය (......)

# නාට්‍ය හා රංග කලාව

## 13 ශ්‍රේණිය

## II පත්‍රය

---

### II කොටස

A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1) I ශාන්තිකර්ම පැවැත්වීමේ මූලික පරමාර්ථ කවරේද? (ලකුණු 4)
   II. ශාන්තිකර්ම හා බෞද්ධ පූජාකර්ම පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 5)
   III. ශාන්තිකර්මයක හා පූජාකර්මයක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. ( ලකුණු 6)

2) I නාඩගම් ප්‍රචලිත වීම සම්බන්ධව පවතින මත දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)
   II. "නාඩගම් පිරිහීම නූර්ති ප්‍රචලිත වීමට හේතු විය" විමසන්න. (ලකුණු 5)
   III. වර්තමාන නාට්‍ය කලාවේ පෝෂණයට නූර්ති නාට්‍ය කලාවෙන් ලැබුන පිටිවහල උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

3) I "සුභ සහ යස" නාට්‍යයට පාදක වූ මූලාශ්‍ර කථාව සැකෙවින් දක්වන්න. (ලකුණු 4)
   II. "සුභ සහ යස නාට්‍යය තුළින් සමාජ, ආර්ථික හා දේශපාලනමය පසුබිම පිළිබඳ විවරණයක් කරයි."විමසීමක් කරන්න. (ලකුණු 5)
   III. "සයිමන් නවගත්තේගම නාට්‍යකරුවා තමන්ටම ආවේණික වූ රටාවකින් නාට්‍ය නිර්මාණය කර ඇත." උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

### B කොටස

4) I ඇන්ටිගනී නාට්‍යයේ ගැටුම් අවස්ථා හතරක් නම් කරන්න. (ලකුණු 4)
   II. ක්‍රියෝන්ගේ අත්තනෝමතික ක්‍රියා කලාපය නාට්‍යයේ ගැටුමට බලපෑ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)
   III. ඇන්ටිගනී නාට්‍ය පෙළ රංගනයක් බවට පත් කිරීමේදී චරිත වල මුවගට නංවා ඇති කාව්‍යමය බස් වහර නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

5) I සංස්කෘත නාට්‍යයේ ආරම්භය පිළිබඳව භරත මුනිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් වන ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 4)
   II. සංස්කෘත නාට්‍ය රංග ශෛලියේ විශේෂ ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 5)
   III. ඉහත සඳහන් කළ ලක්ෂණ අභිඥාන ශාකුන්තලයේ කොතෙක් දුරට භාවිත කර ඇත්දැයි උදාහභරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු6)

6) I යථාර්ථවාදී නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමීන් වූයේ කවරහුද? (ලකුණු 4)
   II. යථාර්ථවාදී රංග රීතියේ විශේෂ ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 5)
   III. "පවුල් සංස්ථාව තුළ ඇති වන ගැටළු වලට මුහුණ දෙන ආකාරය" නූවුරා ගේ චරිතය තුළින් විද්‍යාමාන කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 6)